<u>ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල</u>

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1999 අගෝස්තු 05 දිනැති ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ භාර ඔප්පුවේ 11 (ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ

පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ

පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හුවමාරු නොවන ගණුදෙනුවලින් වන අයභාරය(බදු සහ පැවරුම්) ප්‍රමිතියේ අතිරේකයට අනුව වර්ෂ කිහිපයකට පෙර ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල් සමාගමෙන් (Construction Industry Guarantee Fund	පෙන්වා දුන් පරිදි ප්‍රාග්ධන ප්‍රදාන, සමුච්චිත අතිරික්ත/ ඌණතා යටතේ ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.	රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් ශේෂ නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.

Limited) ලද ප්‍රදානයන් රු.මිලියන 0.98 ක් අරමුදලේ සමුච්චිත අතිරික්තය/ ඌනතාවය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් නිවැරදිව ඉදිරිපත්කර නොතිබුණි.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇපකර මුදල් ඉල්ලුම් (Demands) සඳහා අරමුදල විසින් 2023 වර්ෂයේ දී සේවාදායකයෙක් වෙත ගෙවා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.මිලියන 0.19 ක් අදාල කොන්ත්‍රාත්කරු විසින් 2024 වර්ෂයේ දී නැවත අරමුදල වෙත ගෙවා තිබුණි. මෙම නැවත ලැබීම සමුච්චිත ලාභයට ගැලපීම වෙනුවට අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම් ගිණුමට(Contingent Liability Reserve) බැරකර තිබුණි.	දක්වා ඇති මුදල 2023 වර්ෂයේ සේවාදායකයෙකු වෙත ඇපකරයක් මුදල් කිරීම වෙනුවෙන් ගෙවූ පසු එම මුදල අදාල කොන්ත්‍රාත්කරු විසින් 2024 වර්ෂයේ ප්‍රතිපූර්ණය කරන ලදී. ඉදිරියේදී ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ඇපකර මුදල් ඉල්ලුම් නැවත ලැබීම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය.
(ආ)	පසුගිය වර්ෂය තුල ඉදිරියට කල ගෙවීම් රු. මිලියන 0.42 ක් සමාලෝචිත වර්ෂයේදී වියදම් ලෙස හඳුනා නොගෙන මූල්‍ය ප්‍රකාශනය තුල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු බැවින් ජංගම වත්කම් එම වටිනාකමෙන් අධි ගණනය වී අදාල වියදම් එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.	ඉදිරි මූල්‍ය වසර තුළදී පෙර වසරේ ගැලපුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	පසුගිය වසරේ ඉදිරියට කළ ගෙවීම් වටිනාකම ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2018 ජුනි 05 දින සිට 2023 සැප්තැම්බර් 08 දින දක්වා ණයගැතියන් විසින් අරමුදලේ බැංකු ගිණුම් 05 ක තැන්පත් කර තිබුණු රු. මිලියන 1.88 කට අදාළ ණයගැතියන් හඳුනාගෙන එම ගිණුම් වල ගැලපීමට කටයුතු නොකර ජංගම බැරකම් ලෙස ගිණුම්ගත කිරීම තුළින්	පසුගිය වසර කිහිපය තුළ රටේ උද්ගතවූ තත්ත්වය මත වරින් වර කොන්ත්‍රාත්වරුන් ඇපකර ගාස්තු හෝ වෙනයම් මුදලක් තැන්පත් කිරීම් කිරීමෙන් අනතුරුව අප වෙත නිසි අවස්ථාවන්හි නොදැන්වීම	බැංකු ගිණුම් වෙත සෘජුව මුදල් තැන්පත් කිරීම් හඳුනා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දී ප්‍රමාදයකින් තොරව අදාළ වත්කම් හා වගකීම් ශේෂයන්

අරමුදලේ ජංගම වත්කම් හා වගකීම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	හේතුකොට හඳුනාගැනීමට අපහසු තත්වයක් පැවතිණි. නියමිත ලෙස එම ශේෂයන් හඳුනාගන්නා තෙක් ජංගම බැරකම් යටතේ දක්වා ඇත.	නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.මිලියන	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගෙවිය යුතු ව්‍යාපෘති ශේෂයන් (Payable balance for RRP/RDA projects)	157.83	ශේෂ තහවුරු කිරීමේ ලිපි	ණයහිමි ශේෂ තහවුරු කරවා ගැනීමට අදාළ කොන්ත්‍රාත්වරුන්ට ලිපි යවා ඇති අතර බොහෝ කොන්ත්‍රාත්වරුන් මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැත.	ගෙවිය යුතු ව්‍යාපෘති ශේෂයන් කාලීනව සනාථ කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	ණයගැතියෝ	7.62	ශේෂ තහවුරු කිරීමේ ලිපි	ගිණුම්කරණ හා විගණන කටයුතු ක්‍රියාවලියේ කොටසක් ලෙස අප විසින් අවසාන ණයගැති/ණයහිමි ශේෂ තහවුරු කරවා ගැනීමට අදාළ කොන්ත්‍රාත්වරුන්ට ලිපි යවා ඇති අතර බොහෝ කොන්ත්‍රාත්වරුන් මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැත.	ඵලදායී ක්‍රමවේදයක් අනුගමනය කර ණයගැති/ ණයහිමි ශේෂ තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ඇපකර නිකුත් කරන අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යයසාධනය අඩුවන අවස්ථාවලදී සේවායෝජකයන් ඇපකර මුදල් අරමුදලෙන් ඉල්ලුම් කරන බැවින් 2011 සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 22 දී එලෙස රු. මිලියන 87.65 ක මුදලක් සේවායෝජකයින් වෙත ගෙවා තිබුණු අතර එයින් රු.මිලියන 4.68 ක් අයකර ගත නොහැකිව 2019 වර්ෂයේදී භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් කපාහැර තිබුණි. තවද 2020 සිට 2023 දක්වා සේවායෝජකයින් වෙත ගෙවා අරමුදලට අයවිය යුතු මුදල රු.මිලියන 56.83 ක් විය. මීට අමතරව 2024 වර්ෂයේ දී රු. මිලියන 31.80 ක් ඇපකර මුදල් කිරීමට අරමුදලට සිදුවී තිබුණි.	100% අවධානමක් ඇතිව ඇපකර ලබාදීමෙන් අනතුරුව කොන්ත්‍රාත්වරුන් තම වගකීම් පැහැරහැරීම් මත රු.මි.102ක් ගෙවීමට සිදුවූ අතර, අයකර ගැනීම සඳහා නීති කටයුතු වෙනුවෙන් අතිරේක රු.මි.8ක් පමණ වැයවුවද අයකරගැනීමට නොහැකි විය. කොන්ත්‍රාත්වරුන්ගේ නොමනා චර්යාවන් (Code of Ethics) මෙයට ප්‍රධාන හේතුව වී ඇත.	කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය හා චර්යා සංවර්ධනය කරගැනීම වෙනුවෙන් ඉදිකිරීම්වලට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වී අවධානය යොමුකිරීම සහ මුදල් අයකර ගැනීමට නොහැකිව ඇති අවස්ථා පිළිබඳ ප්‍රායෝගික වැඩ පිළිවෙලක් හඳුන්වාදීමෙන් අවධානම අඩු කිරීමට හා ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	අරමුදල විසින් ඇපකර මුදල් සඳහා විවිධ සේවායෝජකයින්ට ගෙවා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයවිය යුතු රු.මිලියන 68.70 ක් 2024 වර්ෂයේ දී භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් අවදානම වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදනයෙන්(Contingent Liability Reserve) ලියාහැර (write off) තිබුණි. මෙම මුදල තුල 2024 වර්ෂයට පෙර සිට අයවිය යුතුව තිබු	ඇපකර මුදල් කිරීමෙන් පසු වර්ෂ ගණනාවක් ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම මගහැරීම මත වරින්වර දුර්වලතාවය හේතුකොට අවධානම වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් ලියා හැරීමට භාරකාර මණ්ඩලය ඒකමතිකව තීරණය කරන ලද අතර ඇපකර මුදල් කිරීම වෙනුවෙන් සිදුවූ අලාභය අයකර ගැනීමට	- එම -

	රු.මිලියන 51.90 ක් ද, 2024 වර්ෂයේ ඇපකර මුදල් කිරීම වෙනුවෙන් ගෙවූ රු.මිලියන 16.80 ක මුදලක් ද අන්තර්ගත වී තිබුණි. ඒ අනුව සේවායෝජකයන් වෙත අරමුදල විසින් ගෙවා තිබුණු එකතුව රු.මිලියන 102.90 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට නැවත අරමුදලට අයකර ගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් බේරුම්කරණය ඇතුළු නීතිමය ක්‍රියාමාර්ගවල තීන්දු අරමුදලේ වාසියට ලැබී තිබුණද අදාල මුදල් අයකර ගැනීමට නොහැකිව තිබුණු අතර මේ සම්බන්ධ නෛතික කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 3.19 ක් ද වැය කර තිබුණි.	උත්සාහයක් ගනු ලැබුව ද, ඒ සඳහා වර්ෂ ගණනාවක් තුළ සැලකිය යුතු මුදලක් වැය කිරීමට සිදු වී ඇත.	
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව බැඳුම්කර හා ඇපකර වලින් ලැබිය යුතු ශුද්ධ ආදායම රු.මිලියන 7.62 ක් වන අතර මෙම ශේෂය තුල වසර 1ත් 3ත් අතර කාලයක සිට අයවිය යුතු රු. මිලියන 4.69 ක් ද වසර 3ත් 5ත් අතර රු. මිලියන 2.41 ක් ද වසර 5ට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.මිලියන 0.30 ක් ද ඇතුළත් වී තිබුණි. දිගුකාලීනව අයවිය යුතු මෙම ශේෂයන් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතින බවද විගණනයේ දී නිරීක්ෂණය විය.	ප්‍රමාද වුවද අයකර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා බැවින් කෙදිනක හෝ ණය පියවා ගැනීමට අදහස් කරනු ඇත.	බැඳුම්කර හා ඇපකර වලින් ලැබිය යුතු ආදායම් කාලීනව අයකර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු අතර හිඟ ශේෂයන් සම්බන්ධයෙන් ද නොපමාව කටයුතු කළ යුතුය.
(ඇ)	අරමුදලට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙන් (State Development & Construction Corporation) 2012 වර්ෂයේ සිට	ආයතනයේ ප්‍රතිපත්තිමය තීරණ භාරකරුවන් විසින් ගන්නා අතර ආයතනයට අගතියක් විය හැකි හෙයින් ලබා දුන් උපදෙස් මත	ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගැනීමෙන් පසුවත් අයනොවේ නම්

අයවිය යුතු රු. මිලියන 20.80 ක ණය මුදල අරමුදලේ මූල්‍ය ශ්‍රේණිගත කිරීම් සඳහා අහිතකර ලෙස බලපාන බැවින් අයකරගත යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම වෙනුවට භාරකරුවන්ගේ අනුමැතියෙන් 2015 වර්ෂයේ දී කපාහැර තිබුණු නමුත් එම සංස්ථාවේ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මෙම ශේෂය අරමුදලට ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව අයකරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව ගිණුම්වලින් ඉවත් කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.	ලියාහැර ඇත. කෙසේවෙතත් කිසියම් අවස්ථාවකදී ලබා ගැනීමට හැකියාවක් ඇත්තේ නම් වෙනත් ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට සලස්වා ඇත.	පමණක් එම ශේෂ කපා හැරීම 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හා 2023 මැයි 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/01/2021(i) ට අනුකූලව සිදු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 310ක ගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම් කිරීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අරමුදල වෙත රු.මිලියන 35,080.23 ක් ලබාදී තිබුණු අතර එයින් රු.මිලියන34,449.18ක් පමණක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණි. නොගෙවූ මුදලින් රු. මිලියන 157.83 ක් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් (Transits Money) ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙයින් රු. මිලියන 64.57 ක් වසර 01 - 03 ක	දෙපාර්ශවය අතර ගනුදෙනුවේදී කොන්ත්‍රාත් කොන්දේසි හා ඇපකර කොන්දේසිවලින් පරිබාහිර කරුණු හේතු කොට 2025 අප්‍රේල් මාසය වනතුරුද ඇපකරු ලෙස අරමුදල ගැටළු බොහෝමයකට මුහුණ දී ඇත. සේවායෝජක ගිණුම් ක්‍රමයේ දෝෂ හා අන්‍යෝන්‍ය සහයෝගීතාවය බිඳ වැටීම හේතුකොට ඇතිවූ හානිය පියවා ගැනීමේ සංකීර්ණ තත්ත්වය මත අරමුදල අවධානමට ලක්වූ කොන්ත්‍රාත්වරුන්ගෙන් කිහිප දෙනෙකුගේ මුදල් රඳවා ගැනීම වළක්වාගත නොහැකි වී ඇත.	කොන්ත්‍රාත්කරුවන්ගේ සහතික කරන ලද බිල්පත් සඳහා ගෙවීම් කිරීමට නිදහස්කර තිබූ මුදල් සාධාරණ කාලයක් තුළ ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසුව අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

	කාලයක සිටද, රු.මිලියන 19.23 ක් වසර 03- 05 ක කාලයක සිටද රඳවාගෙන තිබුණු අතර එහි ඇතුළත් සම්පූර්ණයෙන් වැඩ නිමවා තිබුණු ව්‍යාපෘතීන් 105 කට අදාළ රු.මිලියන 51.92 ක මුදලද කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැර නොතිබුණි.		
(ආ)	කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැරීම සඳහා වෙනත් විවිධ පාර්ශ්වයන් විසින් අරමුදල වෙත ලබාදී තිබුණු මුදල්වලින් 2024 දෙසැම්බර් 31 දිනට අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත පියවා නොතිබුණු මුදල රු. මිලියන 41.69 ක් විය. මෙම ශේෂයෙන් එකතුව රු. මිලියන 2.22 ක් සහ රු.මිලියන 14.81 ක් වූ මුදල් පිළිවෙලින් වසර 01 - 03 අතර සහ වසර 03- 05 අතර ද රු.මිලියන 2.25 ක් වසර 5ට වඩා වැඩි කාල පරාසයන් තුළ වූ අතර අදාළ ව්‍යාපෘතිවල වර්තමාන කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සේවායෝජකයින් විසින් ලබා දුන් මුදල් මාර්ගස්ත මුදල් ලෙස දීර්ඝකාලීනව අරමුදලේ රඳවා ගැනීම තුළින් අරමුදලේ වගකීම් ඉහළ යන බැවින් එම වගකීම් පියවීමේ අවදානම විගණයේ දී නිරීක්ෂණය විය.	අවදානම හා වගකීම් අවසන් වීමෙන් පසුව රඳවා ගත් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.	- එම -
(ඇ)	බැඳුම්කර හා ඇපකරවලින් කොන්ත්‍රාත්කරුවන්ගෙන් වැඩිපුර අයකරගෙන අරමුදල විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වසර 3ත් 5ත් අතර රු.මිලියන 3.40	බැර ශේෂයෙන් 80% පමණ ප්‍රමාණයක් දැනටමත් නිදහස් කිරීමට කටයුතු කර ඇති අතර වගවීම අවසන් වූ පසු ඉතිරියද නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.	වැඩිපුර මුදල් තැන්පත් කර ඇති කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගෙන එම මුදල් නිදහස් කිරීමට කටයුතු

ක බැර ශේෂයක් ණයහිමියන් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු නමුත් මෙම ශේෂයන් පියවීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.		කළ යුතු අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදි හා සාධාරණ තත්ත්වයක් ඇල්මැති පාර්ශවයන්(Stake Holders) වෙත පෙන්නුම් කිරීමට ද කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අගෝස්තු 08 දිනැති 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 වැනි වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නිකුත් කරන ලද මුදල් රෙගුලාසි 876 (3)	මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කල යුතු අතර, මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට එක් වසරක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතුය. එසේ වුව ද, එම අරමුදල දිගටම පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත් නියම කරන පරිදි එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි වුවත් 2025 අප්‍රේල් 30 දින වන විටත් අරමුදල ඊට අනුකූලව නීතිගත කර නොතිබුණි.	අරමුදලෙහි ව්‍යුහය හා අවශ්‍යතාවය පිළිබඳ 2024 වර්ෂයේ සහ 2025 වර්ෂය පළමු භාගයේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ගේ සහ අධ්‍යක්ෂක ජෙනරාල් (රාජ්‍ය මුදල්) රැස්වීම් කිහිපයක් පැවති අතර වසර 25ක් තුළ ඒකාබද්ධ අරමුදලට බලපෑමක් නොකර සාර්ථක ලෙස කරන ලද සේවාව ඇගයීමට ලක් කිරීමේදී රජයට ආදර්ශමත් අරමුදලක් ලෙස පවත්වාගෙන යාම පිළිබඳ ලේඛනගත කිරීමත් ස්ථාපිත අරමුදලක් ලෙස පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය රාජ්‍ය මුදල් කළමනාකරන පනත යටතේ ප්‍රමුඛත්වය ලබා දීමට සහතික විය. මෙහිදි ජාත්‍යන්තර මූල්‍ය ඇගයීම් ආයතනයක් ලෙස ෆිච් රේටින්ස් ආයතනයේ (Fitch	අදාළ පනත හා චක්‍රලේඛ මඟින් නිකුත් කර ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර එසේ නොවන අවස්ථා සඳහා පනත ප්‍රකාරව නිසි අනුමැතීන් ලබාගත යුතුය.

			Ratings) 2018 වසරේ සිට අඛණ්ඩභාවය (BB හා ධනාත්මක) විශේෂ සැලකිල්ලට භාජනය වීමෙන් ආයතනයේ මූල්‍ය ශක්තිය හා ස්ථාවරත්වය සහතික වී ඇත.	
(ආ)	1999 අගෝස්තු 05 දිනැති ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල් භාර ඔප්පුවේ 9 (ඊ) වගන්තිය	භාරකාර මණ්ඩලයට වැටුප්, දීමනා හෝ ගරු වැටුප් ලබා ගැනීමට අයිතියක් නොමැති නමුත් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් ප්‍රතිපූරණය කළ හැකි වේ. නමුත් ඊට පටහැනිව, අරමුදල විසින් මණ්ඩලයේ වෘත්තීය හැකියාව මත අමතර සේවාවන්හි යෙදීම වශයෙන් රාජකාරි ඉටුකිරීම සඳහා මාසිකව රු.50,000 බැගින් වූ ස්ථාවර මුදලක් ලෙස එකතුව රු.මිලියන 2.50 ක්, රු.මිලියන2.30 ක්, රු.මිලියන 2.50 ක් හා රු.මිලියන3.00 ක් පිළිවෙලින් 2021, 2022, 2023 සහ 2024 වර්ෂයන් තුලදී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, භාරකාර මණ්ඩලය විසින් රාජකාරි ඉටු කිරීම සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි. මෙම සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සම්බන්ධව කිසිදු හෙළිදරව් කිරිමක් මූල්‍ය ප්‍රකාශන මගින් සිදු කර නොමැති බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.	භාරකාර මණ්ඩලයට ඔවුන්ගේ මාසික කාර්යය සාධනය වෙනුවෙන් පමණක් පෙර තීරණය කරන ලද මුදලක් මාසිකව ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙහිදී ඔවුන්ගේ කාර්යය සාධනය තහවුරු කර ගැනීම සඳහා නාම ලේඛණයක අත්සන් කරන අතර හුදෙක් පැමිණීම සඳහා නොවන බැව් සඳහන් විය යුතුය. භාර ඔප්පුවේ 9(එෆ්) යටතේ තනතුරට අදාළ වගකීම් තුළින් ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ උන්නතිය හා එදිනෙදා ක්‍රියාකාරීත්වයට අභිතකර කරුණු පිළිබඳ නිරන්තර සමාලෝචනයට භාජනය කරනු ඇත.	අරමුදලේ භාර ඔප්පුවේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතු අතර එසේ නොවන අවස්ථා වලදී ඒ සඳහා නිසි අනුමැතීන් ලබාගෙන අදාළ ලිපි ලේඛන විගණනය වෙත ද ඉදිරිපත් කළ යුතුය.

(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය මගින් සංශෝධිත 877(2) (ආ) මුදල් රෙගුලාසිය	අරමුදල සඳහා ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව ලැබෙන අධිකාරී බලයකින් හෝ මුදල් රෙගුලාසි විධිවිධාන යටතේ ලැබෙන අධිකාරී බලයකින් තොරව අරමුදලේ වියදම් කිසිවක් නොදැරිය යුතු වුවද, අරමුදල විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්ෂේත්‍රගත නිලධාරීන් 14 දෙනෙකු සඳහා මාසිකව ප්‍රවාහන දීමනා ලෙස ස්ථාවර මුදලක් එනම් මාසිකව එකතුව රු.211,500 ක් බැගින් වර්ෂය තුල මුළු එකතුව රු.මිලියන 2.54 ක්ද සේවකයින් සඳහා වර්ෂය තුල රු.මිලියන 1.71 ක් ද ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි.	ආයතනයේ සමස්ථ ක්‍රියාවලිය, භාණ්ඩාගාරය වෙනුවෙන් පෙනී සිටින සාමාජිකයෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයේ වගකීමක් වන අතර ඒ සඳහා ප්‍රතිපාදන භාර ඔප්පුවෙන් ඔවුන් වෙත පවරා ඇත. තවද බේරුම්කරුගේ උපදෙස් මගින්ද ස්ථිර කර ඇත.	යොමුගත චක්‍රලේඛයෙන් සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව සිදු නොකළ වියදම් සඳහා වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 23 දිනැති අංක SEC/2022/E/03 දරණ දේශීය අදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 ඡේදය අනුව 2023 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිදහස් කර ඇති ප්‍රමාණ හැර ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත ගෙවීම් කරන තැනැත්තාගේ සේවා නියුක්තිකයෙකු නොවන වාසික පුද්ගලයෙකු වෙත සේවා ගාස්තුවක් කිරීමේ දී ලිත් මාසයකට මුළු ගෙවීම රු. 100,000 ඉක්මවන්නේ නම් චක්‍රලේඛය ප්‍රකාරව මාසික මුළු ගෙවීම මත සියයට 5 ක් රඳවාගැනීමේ බද්ද අඩු කළ යුතු	නීතිඥ සේවාව ලබා ගැනීමෙන් අනතුරුව සමීප දිනයකදී ගෙවීම් කරනු ලබයි. අදාළ එක් මාසයක් තුළ නැවත නැවත එම සේවාව ලබා ගැනීම අනුමාන කිරීමට නොහැකි හෙයින් වාර කිහිපයක ගාස්තු ප්‍රමාද කර ගෙවීමේ හැකියාවක් නොමැත. එසේ හෙයින් ගෙවූ සෑම අවස්ථාවක්ම බදු සඳහා යටත් නොවන වටිනාකමක් හෙයින් ඒ සම්බන්ධයෙන් අවශ්‍යතාවයක් පැන නැගී නැත.	චක්‍රලේඛය ප්‍රකාරව රඳවා ගැනීමේ බදු අඩුකර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

වුවද අරමුදල විසින් නීති කටයුතු සඳහා එක් නීතිවේදියෙක් වෙත මාස 6ක් සඳහා රු.මිලියන 1.08ක් ගෙවා තිබූ නමුත් මසක් තුල රු.100,000 ඉක්මවා කල ගෙවීම් වෙනුවෙන් රඳවාගැනීමේ බද්ද අඩුකර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ)	අරමුදලේ නිලධාරීන් වෙත වර්ෂය තුල ප්‍රවාහන දීමනා රු.මිලියන 2.54 ක් හා අතිකාල දීමනා රු.මිලියන 1.42 ක් ගෙවා තිබුණු නමුත් 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරණ දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනයේදී එම ගෙවීම් සැලකිල්ලට ගෙන නොතිබුණි.	අදාළ මාසය තුළ ගමන් වියදම ප්‍රතිපූර්ණය කිරීම පසු මාසයන්හි කිරීම හේතු කොට ගෙවන අවස්ථාවේදී සීමා කරන ලද වටිනාකම ඉක්මනොවූ හෙයින් ගැලපීම් කිරීමට අවශ්‍යතාවයක් පැන නැගී නැත.	චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් කරනු ලබන සියලු දීමනා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේ දී සැලකිල්ලට ගත යුතු අතර චක්‍රලේඛ විධිවිධාන පිළිබඳ නිසි අවබෝධයකින් හා අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 252.06 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 332.69 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 80.63 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බැඳුම්කර සහ ඇපකර ආදායම රු.මිලියන 3.68 කින් අඩු වීම, ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.මිලියන 52.09 කින් අඩු වීම හා උපදේශන කටයුතු සඳහා බාහිර පාර්ශවයන් වෙත ගෙවීම රු.මිලියන 2.34 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විස්තරය	ප්‍රවර්ථන වෂර්යේ ශේෂය රු.	ඉකුත් වෂර්යේ ශේෂය රු.	වෙනස වැඩිවීම/(අඩුවීම) රු.	වෙනසේ ප්‍රතිශතය සියයට
ආදායම්				
බැඳුම්කර හා ඇපකර ආදායම	9,779,425	13,455,756	(3,676,331)	27
ස්ථාවර තැන්පතු පොලී	313,269,041	365,362,719	(52,093,678)	14

ආදායම				
භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	78,304,782	68,635,138	9,669,644	14
අනෙකුත් ආදායම	267,567	5,569,321	(5,301,754)	95
වියදම්				
පුද්ගලික වැටුප්	70,500,898	63,728,178	6,772,720	11
ප්‍රවාහන	7,201,350	6,514,435	686,915	11
මෙහෙයුම් පිරිවැය	2,100,285	1,208,931	891,354	74
උපාය මාර්ග සහ ප්‍රතිපත්ති	3,181,565	2,657,913	523,652	20
උපදේශනය	3,190,500	846,340	2,344,160	277
යටිතල පහසුකම්	7,433,953	6,433,830	1,000,123	16

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 9:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය 6:1 ක් විය.

(ආ) වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය පසුගිය වර්ෂයේ සියයට 12ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 8 ක් දක්වා අඩුවී තිබුණු බැවින් අරමුදලේ වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කරගෙන නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල 1999 දී ආරම්භ කර තිබුණු අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 55 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබාදී තිබුණි. එහෙත් වාර්ෂික ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 949.79 ක් වූ රඳවා ගත් ඉපැයීම්වලින් රු.මිලියන 500 ක් "යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන" නම් සංචිත ගිණුමකට මාරු කර නිෂ්කාර්යව පැවතුණි.	භාර ඔප්පුවේ වගන්ති ප්‍රකාරව ලාභ නොලබන සේවා ආයතනයක් ලෙස ලැබුණු අරමුදල් සහ ලැබෙන ආදායම ඇපකර ලබා දීම සඳහා සංචිතයක් ලෙස භාවිතා කිරීමටත් එම සංචිතයේ ඕනෑම අවස්ථාවක ඇති වටිනාකමින් දස ගුණයක ඇපකර ලබා දීමට අවකාශ ඇත. එහෙයින් සංචිතය නඩත්තු කිරීම හා පුළුල් කිරීම ආයතනය සතු වගකීමකි. තවද මූල්‍ය ආයතනයක් ලෙස සමාජයේ පිළිගැනීමට තමන්ටම අයත් ස්ථානයක් නොමැති වීම	අරමුදල සම්පූර්ණයෙන්ම රාජ්‍ය ආයතනයක් වන බැවින් අරමුදල විසින් උපයන ලද අතිරික්තය හෝ අතිරික්තයේ කොටසක් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම තුළින් ආර්ථික

		හේතුකොට භාරකාර මණ්ඩල ඒකමතික තීරණයක් අනුව වත්කම්වලින් කොටසක් ඒ සඳහා ප්‍රතිපාදන ලෙස වෙන් කර ඇත.	සංවර්ධනය ඉහළ නංවාලීමට කටයුතු කළ යුතුය.
(ආ)	අරමුදල සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කර සංවර්ධනය කිරීම වෙනුවෙන් අරමුදල විසින් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ රු.මිලියන 2.98 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. ගිවිසුම පරිදි පළමු වාරිකය සහ සංවර්ධනය කිරීමෙන් පසු ගෙවිය යුතු දෙවන වාරිකයද වශයෙන් එකතුව රු. මිලියන 2.08 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70 ක් 2015 සහ 2016 වර්ෂවල දී අදාළ ආයතනය වෙත ගෙවා තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෘදුකාංග සංවර්ධන අත්තිකාරම් මුදල් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.මුදල් ගෙවා වර්ෂ 09 ක් පමණ ගත වුවද 2025 මාර්තු 31 වන දින දක්වාම මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සකස් කිරීම අවසන් කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර කාර්යය නිම කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අරමුදල අපොහොසත්ව තිබුණි.	කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) අවශ්‍යතාවය 2015 වසරේ සපුරාලීමට කටයුතු කළද එතැන් සිට රජයේ ප්‍රතිපත්තීන් භාණ්ඩාගාර චක්‍ර ලේඛණ CIDA කොන්දේසි වරින් වර සංශෝධනය කිරීම හේතු කොට ඍජු ස්වයංක්‍රීය පද්ධතියක් නිර් මාණය කිරීමට කල්ගතවූ අතර 2025 වසරේද භාරකාර මණ්ඩලය පවත්නා ක්‍රමවේදයන් සංශෝධනය කිරීම සහ කොන්ත්‍රාත්වරුන්ගේ කාර්යයසාධන සීමාවන් රජය මගින් වෙනස් කිරීමත් ජාතික ප්‍රසම්පාදන කොමිසම මගින් නිකුත් කරන ලද නිර්ණායක මත ගැලපීමට කාලයක් ගතවන බව පැහැදිලිය. මෙහිදී විශේෂ කරුණක් වූයේ එකඟ වූ මුදල වර්තමාන වටිනාකම හා සසඳන කළ ඉතා සුළු ප්‍රතිශතයක් වන හෙයින් එම කටයුත්ත එසේ නිම කරවා ගැනීම මූල්‍ය වශයෙන් වාසිදායක වනු ඇත.	කළමනාකරණ තොරතුරු පද්ධතිය වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි සාර්ථකව සකස්කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අරමුදල බැඳුම්කර හා ඇපකර ආදායම (Bond and Guarantee Levy Income) ගණනය කිරීමේ දී කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘති සඳහා බැඳුම්කරයේ	භාරකාර මණ්ඩලය ප්‍රතිපත්ති පිළිබඳ කටයුතු කරන අතර අනෙකුත් සියළු වගකීම් හා ගාස්තු නිර්ණය කිරීම ඇතුළුව හා පූර්ණ	භාරකාර මණ්ඩලයේ අනුමැතිය හා කළමනාකරණය

	වටිනාකමෙන් සියයට 2 ක් හා සියයට 2.5 ක් පිළිවෙලින් අත්තිකාරම් බැඳුම්කර (Advance Bond) හා කාර්යය සාධන බැඳුම්කර (Performance Bond) සඳහා අයකර ඇති අතර බැඳුම්කර කාලය දීර්ඝ කිරීමේ දී අයකරන සේවා ගාස්තුව අත්තිකාරම් බැඳුම්කර හා කාර්යසාධන බැඳුම්කර සඳහා පිළිවෙලින් සියයට 1.5 ක් හා සියයට 1.75 ක් වුවත් මෙම ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විශේෂ කළමනාකරණ වාර්තා පිටපතක් විගණනයට ඉදිරිපත් කළද භාරකාර මණ්ඩලයේ අනුමැතිය සහිත රැස්වීම් වාර්තා පිටපත් විගණනයට ඉදිරිපත් නොවීය. තවද, බැඳුම්කර හා ඇපකර ආදායමට පවතින අවදානම අනුව යම් රේටයක් අමතරව එකතු කර තිබුණු අතර මෙම අගය කළමනාකරණය විසින් පවතින අවදානම් තක්සේරු කොට බැඳුම්කර හා ඇපකර ආදායමට එකතු කරන බව දැන්වුවද අවදානම් තක්සේරුව පිළිබඳ කිසිදු ලියවිල්ලක් හෝ සාකච්ඡා සටහන්ද බැඳුම්කර සේවා ගාස්තුවට අදාළ මූලාශ්‍ර ලියවිලි ද විගණනයට ඉදිරිපත් නොවීය.	මෙහෙයුම් ඉහළ කළමනාකරණය පවරා ඇත. ඒ අනුව සම්මත අවම ගාස්තුව හෝ අවධානම අවම කිරීමේ පියවරක් ලෙස එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගාස්තු නිර්ණය කිරීමත් එම තීරණයන් පොදු වාර්තාවක් ලෙස නඩත්තු කරනු ඇත.	විසින් ගනු ලබන තීරණ බැඳුම්කර හා ඇපකර ආදායම් ලිපිගොනුවල ලේඛනගත විය යුතු අතර එම තොරතුරු හා ලිපි ලේඛන විගණන කටයුතු සඳහා ලබා දීමට ද කටයුතු කළ යුතුය.
(ඇ)	අරමුදල 2024 හා 2023 වර්ෂයන්හි කාර්යමණ්ඩලය රෝහල්ගත වීම් සහ හදිසි අනතුරු ඇතුළු වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය සඳහා පිළිවෙලින් රු.මිලියන 2.90ක් හා රු.මිලියන 5.51 ක් වියදම් කර තිබුණි. එම වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය භාණ්ඩාගාර අනුමැතිය සහිතව නිසි ක්‍රමවේදයක් යටතේ සිදුකිරීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.	භාර ඔප්පුවේ සහ බේරුම්කරු විසින් ලබා දී ඇති උපදෙස් අනුව ආයතනයේ ක්‍රියාවලිය ක්‍රමවත්ව හා අඛණ්ඩව රැකගැනීම සඳහා ගන්නා ලද පියවරක් ලෙස හදිසි අනතුරු හා එවැනි අවස්ථාවන්හිදී කාර්යය මණ්ඩලය වෙත ආයතනයේ සහය දෙනු ඇත.	අරමුදල විසින් සිදුකරනු ලබන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ ඇතුළු ඒ හා ආශ්‍රිත අනෙකුත් වියදම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.

(ඉ)	අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අඛණ්ඩව සමාලෝචනය කර කාලීනව පාලක මණ්ඩලයට වාර්තා කිරීම සඳහා විගණන හා කළමනාකරන කමිටු පැවැත්විය යුතු වුවත් අරමුදල කිසිදු දිනක විගණන හා කළමනාකරන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. එමෙන්ම මුදල් අමාත්‍යාංශයේ හෝ ඉදිකිරීම් අමාත්‍යාංශයේ හෝ විගණන හා කළමනාකරන කමිටු සඳහාද සහභාගීත්වයක් නොවුණි.	භාරකාර මණ්ඩලය භාර ඔප්පුවේ අනුගත හා කලින් කලට බේරුම්කරු විසින් ලබා දුන් උපදෙස් මත විගණන හා කළමනාකරන කමිටුවක් පැවැත්වීමට කටයුතු කර තිබුණි. එම කමිටුව වාර්ෂිකව සුදුසු ලෙස රැස්වීම් පවත්වා ආයතනික සේවා කටයුතු වඩාත් ක්‍රමවත්ව හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.	පාලක මණ්ඩලයට අවශ්‍ය සහාය ලබා ගැනීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් බිල්පත් වට්ටම් කර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු මුදලින් සේවායෝජකයින් විසින් බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා පියවා ගත නොහැකි වූ මුදල් ශේෂය රු. මිලියන 10.30 ක් විය. මෙම මුදල් ඉදිකිරීම් ආයතන දෙකකින් වසර 04 කට අධික කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. 2024 වර්ෂයේ දී මෙම සම්පූර්ණ මුදලම භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් ලියාහැර තිබුණි.	කොන්ත්‍රාත්වරුන්, ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලට සහ සේවායෝජකයන් හට තම වගකීම නිසි ලෙස ඉටු නොකිරීම හේතු කොට ඇපකර ලබා දුන් ආයතනයක් ලෙස මෙවැනි ඉරනමකට පාත්‍රවීම නිරායාසයෙන් සිදුවනු ඇත.	පාඩු සිදුවීම වළක්වා ගත යුතු අතර ලියා හැරීමෙන් අනතුරුව ද අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. අරමුදලේ මෙහෙයුම් කටයුතු උපරිම කාර්යක්ෂමතාවයකින් මෙන්ම ඵලදායීව සිදුකිරීමට පාලක මණ්ඩලය විසින් කටයුතු කිරීම තුළින් අලාභ අවම කරගැනීමට නොපමාව පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 මගින් නිකුත් කරන ලද 877(2)(ඉ) මුදල් රෙගුලාසියට අනුව, අරමුදලේ ගණන් දීමේ නිලධාරියා විසින් නියමිත විධිවිධාන යටතේ භාෂා තුනෙන්ම වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කළ යුතු අතර එක් එක් මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉහත වාර්තාව සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2025 මාර්තු 31 දිනවන විට 2021, 2022 සහ 2023 වසර සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තා භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කල ද විගණිත මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව ඊට ඇතුලත් කර නොතිබුණු අතර වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	බේරුම්කරු වෙත කාර්තු වශයෙන් මූල්‍ය කාර්යයසාධනය, වාර්ෂික අයවැය, වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා වාර්ෂික වාර්තාව ආරම්භයේ සිට නිරන්තරයෙන්ම ඊලඟ වර්ෂයේ පළමු මාසය තුළ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ප්‍රථමයෙන් වාර්තා පිළියෙල කරනු ලැබූ භාෂාව (සිංහල/ඉංග්‍රීසි) විගණනයට පෙර ගිණුම් සමඟ යවනු ලබයි. ඉන්පසුව අදාළ සියළු වාර්තා අනෙකුත් භාෂා 2න්ම පිළියෙල කර පසු අවස්ථාවක ඉදිරිපත් කරයි. විගණනයෙන් පසු අවසන් මූල්‍ය ප්‍රකාශනද පසු අවස්ථාවක ඉදිරිපත් කරයි. එසේ තොරතුරු ලැබුණු බවත් සනාථ කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන නිවැරදිව අධ්‍යනය කර ඊට අනුකූලව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද 877 (1) (ඇ) මුදල් රෙගුලාසියට අනුව, ඉදිරි වර්ෂය සඳහා භාරකාර මණ්ඩලය විසින් සකස් කරන ලද අයවැය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවද 2024 වර්ෂය සඳහා අරමුදලේ අයවැය වෙනුවෙන් ඉහත පරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි.	අයවැයෙහි සියළු අන්තර්ගතයන් විශ්ලේෂණය කර භාරකාර මණ්ඩලය අනුමත කරන අතර වැඩිදුර නිර්දේශ සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළද එහි සඳහන් අය හෝ වැය ඒකාබද්ධ අරමුදලට කිසිදු ආකාරයකින් බලනොපාන බැවින් සටහන් කරගත් බවත් භාර ඔප්පුවේ විධිවිධාන අනුව භාරකාර මණ්ඩලය මගින් පමණක් කළ හැකි බැව් දන්වා ඇත.	චක්‍රලේඛ විධිවිධාන නිවැරදිව අධ්‍යනය කර ඊට අනුකූලව කටයුතු කළ යුතුය.